Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade	6 ශ්‍රේණිය	**ක්‍රිස්තියානි ධර්මය**	කාලය / நேரம் / Time — පැය 2 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

I - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා ලියන්න.**

(ප්‍රේමය, ඒදන් උයන, මනස්ථාපනයේ, චක්‍රාකාරව, විශ්වාසය)

01.

1. දෙවියන් වහන්සේ කෙරෙහි ..... තබමින් උන්වහන්සේට අයිති දරුවන් ලෙස ජීවිතය ගෙවමු.
2. පළමු මිනිසා ..... හි පදිංචි කරවූ සේක.
3. දේව මැවිල්ල තුළ ..... පවතින නිර්මාණ ද ඇත.
4. ජෝර්දාන් ගඟ අසල දී..... බෞතීස්මය ස්නාවක ජොහාන් විසින් ලබා දුන් සේක.
5. අප මෙලොව ජීවත් වනුයේ දෙවියන් වහන්සේගේ .....නිසාය.

(2×5 = 10)

02. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

1. අසරණ වූ ජුදෙව්වාට පිහිට වූයේ (ලෙවිවරයෙක් / සමරිතානුවරයෙක්) ය.
2. ගාසාවට යන මාර්ගයේදී පිලිප් විසින් (ඉතියෝපිය/ මිසර) ජාතිකයෙකුට ශුද්ධ ලියවිල්ල පහදා දෙන ලදී.
3. ජේසුතුමාගේ බෞතිස්මයේදී (කොබෙයියකු/ පරවියකු) ආකාරයෙන් ශුද්ධාත්මයාණන් පැමිණි සේක.
4. එඬේරුන්ට ජේසු උපතේ දී ලැබුන සලකුණ (තරුව/ ගව ඔරුව) වේ .
5. දස පණත (මෝසේස්ට / ආරොන්ට) දේව පියා විසින් සීනයි කන්දේදී ලබා දුන් සේක.

(2×5 = 10)

03. හරි (√) වැරදි (×) ලකුණු කරන්න.

1. පළමුවෙන්ම දේව වචනය ලියන ලද්දේ පැපිරස් නම් කොළවලය. (.....)
2. ලාදුරු රෝගය අතීතයේ දී භයානක රෝගයක් නොවේ . (.....)
3. ශුද්ධ බයිබලයේ අවසාන පොත එළිදරව්ව වේ. (.....)
4. දාවිත් රජතුමා ඉතා ශ්‍රේෂ්ඨ රජතුමෙකි. (.....)
5. ජේසුතුමා ගල් රොටි කර කෑ සේක. (.....) (2×5 = 10)

Past Papers Wiki

04. යා කරන්න.

(අ)	(ආ)
1. දෙවිදුන්ගේ ප්‍රියාදර පුත්‍රයා	* ජෙරුසලම් දෙවි මැඳුරේ
2. ජේසුතුමා කුරුසිය උසුලාගෙන ගියේ	* ගාබ්‍රියෙල්
3. ජේසු කුමරා කුඩා කල පඬිවරුන් සමඟ රැඳී සිටියේ	* කපාල පිටියට
4. සුභ පණිවිඩ ගෙනෙන දේවදූතයා	* සහයෝගයෙන් ජීවත් වෙමු
5. අසල්වාසීන් සමඟ	* ජේසුස් වහන්සේ

(2×5 = 10)

II - කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.

01. I. පරිසරය විනාශ වන ආකාර 4 ක් ලියන්න.
II. පරිසරය ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් 4 ක් ලියන්න.

02. I. ශුද්ධ බයිබලය ගැන කරුණු 4 ක් ලියන්න.
II. ශුද්ධ බයිබලයෙන් ඔබ ලබා ගන්නා ප්‍රයෝජන 4 ක් ලියන්න.

03. I. ජේසුතුමා මරණයෙන් උත්ථාන වූ දින, දර්ශනය වුයේ කාහටද?
II. එම්මාවුස් ගමට ගෝලයන් දෙදෙනකු යන විට සිදු වූ සිද්ධිය පැහැදිලිව ලියන්න.

04. I. කමා වීම ගැන ස්වාමීන් වහන්සේගේ යාච්ඤාවේ ඇති පදය ලියන්න.(මුළු යාච්ඤාවම ලියා එම පදය යටින් ඉරක් අඳින්න.)
II. අකීකරු පුත්‍රයාගේ කථාව ලියන්න.

05. I. දස පණතේ ඔබ උගත් පණත් 5 ක් ලියන්න.
II. පව් නොකර සිටින්නට දේව පියාගේ උදව් ඉල්ලා යාච්ඤාවක් ලියන්න.(වචන 50 ක්)

06. I. ජේසුතුමාගේ උපත ගැන කරුණු 5 ක් ලියන්න.
II. මෙවර නත්තලේ දී ඔබට දිළිඳුන් උදෙසා කරන්නට සිතෙන වැඩ පිළිවෙලක් විස්තර කර ලියන්න.

(5+5 = 10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank